ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2005

දිලික්ත නීතිය – LWU 3326 / 4326

කාලය - පැය තුනයි

---

දිනය: 2006 මැයි මස 03 වන දින    වේලාව: ප. ව. 1.30 සිට ප.ව. 4.30 දක්වා

---

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

1. උද්ගතවිය හැකි ප්‍රායෝගික අවස්ථාවන්හි අසීමිත පරාසය හා විවිධත්වය නිසා උද්ගත විය හැකි සියලු අවසථා සඳහා හැසිරීම් පිළිබඳ දැඩි සම්මතයන් සැකසීම දුෂ්කර වන්නාක් මෙන්ම යෝග්‍ය ද නොවේ. එහෙයින් නොසැලකිල්ල සඳහා වගකීම තීරණය කිරීමේ නීතිය අවශ්‍යයෙන්ම නම්‍යශීලීව පැවතිය යුතු අතර මහජන ප්‍රතිපත්තියේ හා යුක්තියේ අවශ්‍යතාවලට අනුකූලව නීතිය අදාල :කිරීම සඳහා විනිශ්චයකාරවරුන්ට නිදහස ලබා දිය යුතුය.

   නොසැලකිල්ල පිළිබඳ නඩු නීතිය මෙම පරමාදර්ශය සපුරාලන්නේ ද නැතහොත් එය නුදෙක් නොගැලපෙන හා ව්‍යාකූල රීති සමුදායක් වී ඇත්දැයි ඔබ සිතන්නෙහි ද? ඔබේ පිළිතුර පැහැදිලි කිරීම සඳහා මූලධර්ම හා නඩු තීරණ ගෙනහැර දක්වමින් සාකච්ඡා කරන්න.

2. තනි නොසැලකිලිමත් ක්‍රියාවක් හේතුකොටගෙන අනපේක්ෂිත හා පූර්වේක්ෂණය කළ නොහැකි ප්‍රතිඵල උද්ගත වන අවස්ථාවක දී විත්තිකරු මත ඔහු විසින් සිදු කරන ලද වරදට සම්පූර්ණයෙන් නොගැලපෙන වගකීමක් පැවරීම අසාධාරණ බව පෙනී යයි. අනෙක් අතට ඔහු වගකීමෙන් මුදා හැරීමෙන් සිදු විය හැක්කේ තමන්ට විඳින්නට සිදු වූ හානිය සඳහා සහනයක් ලබා ගැනීම පීඩාවට පත් අහිංසක පාර්ශවයට අහිමි කිරීමයි. - "දිලික්ත නීතිය" දෙවන පිඬුව 56 වන පිටුව.

   මෙම උභතෝකෝටික ගැටලුව විසඳීම සඳහා අධිකරණ විසින් ගනු ලැබූ ප්‍රයත්නයන් විග්‍රහ කරමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. මේ සම්බන්ධයෙන් අධිකරණ විසින් සකස් කර ඇති රීති යෝග්‍ය සමබරතාවක් ඇති කිරීමට උපකාරි වන්නේයැයි ඔබ සිතන්නෙහි ද?

3. රාත්‍රී සමාජ ශාලාවකට ගිය රාමා සහ ක්‍රිෂ්ණා අධික මත්පැන් ප්‍රමාණයක් පානය කළහ. ඉන්පසු අධික ලෙස මත්පැන් පානය කරමින් සිටි මුරලි සමග තරගයට මෝටර් සයිකල් පැදීම සඳහා තමා සිය මෝටර් සයිකලයෙන් ක්‍රීඩා අමාත්‍යංශ ක්‍රීඩා පිටියට යන බව රාමා ක්‍රිෂ්ණාට දැන්විය. ක්‍රිෂ්ණා රාමාගේ මෝටර් සයිකලයේ පිටුපස වාඩි වී ගමන් කළ අතර රාමා හා මුරලි ක්‍රීඩා පිටිය වටේ තරගයට ධාවනය කිරීම ආරම්භ කළහ. රාමාට සිය මෝටර් බයිසිකලය පාලනය කර ගත නොහැකි වූ අතර ක්‍රිෂ්ණා ඉන් ඉවතට විසි විය. ආරක්ෂක හිස් වැස්මක් පැළඳ නොසිටි ඔහුගේ හිසට බරපතල තුවාල සිදු විය. ක්‍රිෂ්ණා රෝහලට ගෙන

යාමට උපකාර කළ මුරලී ක්‍රිෂ්ණා තුවාල වී වැටී සිටි ආකාරය දැකීමෙන් හා ඔහු මිය යතැයි විශ්වාස කිරීම නිසා පසුව දැඩි මානසික අවපීඩනයකට ලක් විය.

ක්‍රිෂ්ණා හා මුරලී වන්දි ඉල්ලා රාමාට එරෙහිව නඩු පවරති. සහායක නොසැලකිල්ල සහ වොලන්ටි නොන් ෆිට් ඉන්ජූරියා (*volenti non fit injuria*) යන රක්ෂණ අයැද සිටීමට රාමා අදහස් කරයි. තමන්ට එම රක්ෂණ ආයාචනය කළ හැකි දැයි රාමාට උපදෙස් දෙන්න.

4. (අ) බෙහෙත් වගයක් මිල දී ගැනීම සඳහා රොමේෂ් සිය සිව් හැවිරිදි පුත්‍රයා වන දිනේෂ් සමග ඖෂධ සැලකට ගියේය. රොමේෂ් ඖෂධවේදියා සමග කථා කරමින් සිටිය දී දිනේෂ් ඖෂධ සැලෙහි ඔබමොබ ඇවිදිමින් සිටියේය. කවුන්ටරය යටින් රිංගා වෙළඳ සැලේ පිටුපසට ගිය දිනේෂ් පොළොව මත ගබඩා කර තිබූ පෙට්ටි කිහිපයක් දුටුවේය. පෙට්ටියක් විවෘත කළ ඔහු සීනි තැවරූ පෙති කිහිපයක් ගිල්ලේය. දිනේෂ් කරමින් සිටි ක්‍රියාව දුටු රොමේෂ් කවුන්ටරය යටින් රිංගා දිනේෂ් කරා යැමට ගත් විට තියුණු ඇණියකට ඔහුගේ හිස කැපිණි.

ශල්‍ය කර්මයක් කිරීම සඳහා රොමේෂ් රෝහලට ඇතුලත් කරන ලදි. තමන් ගිල දැමූ පෙතිවල ක්‍රියාකාරිත්වය නිසා පැය කිහිපයකට පසු දිනේෂ් සිහි විසඥ තත්ත්වයට පත් විය.

රොමේෂ් හා දිනේෂ් සම්බන්ධයෙන් ඖෂධවේදියාගේ වගකීම සාකච්ඡා කරන්න.

(ආ) "අනවසර ඇතුල්වන්නෙකු (trespasser) කෙරෙහි පරිශ්‍රයක වාසය කරන්නෙකු සතු වගකීම සම්බන්ධයෙන් රෝම ලන්දේසි නීතය හා ඉංග්‍රීසි නීතිය අතර පැවති වෙනස අධිකරණ සහ ව්‍යවස්ථාදායක මැදිහත්වීම් හේතුකොටගෙන අපැහැදිලි වී ඇත."

අනවසර ඇතුල්වන්නන් සම්බන්ධයෙන් නීති ක්‍රම දෙක විසින් අනුගමනය කරනු ලැබූ ක්‍රියාමාර්ග විවේචනාත්මක ඇගැයීමකට ලක් කරන්න

5. (අ) දහතුන් හැවිරිදි ජීවන් තම පෙම්වතිය වූ ජානකී සමග උපන් දින සාදයකට සහභාගි වීමට යාම පිණිස තම පියාගේ මෝටර් රථය ඉල්ලා ගත්තේය. ජීවන්ගේ නොසැලකිලිමත් රිය පැදවීම නිසා අතරමග දී රිය අනතුරක් සිදු වූ අතර ඉන් ජානකී බරපතල ලෙස තුවාල ලැබුවාය. ජානකීගේ දෙමාපියෝ ජීවන්ගේ පියාගෙන් වන්දි ඉල්ලා සිටි නමුත් ඔහු වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කළේය. ජීවන්ගේ පියාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඔවුහු දැන් අදහස් කරති.

සාකච්ඡා කරන්න.

(ආ) චර්ම රෝගයකට ප්‍රතිකාර ගැනීම සඳහා නිමාලි මහනුවර පිහිටි නවයුගය නම් පුද්ගලික රෝහලකට ගියාය. රෝහලේ බාහිර චර්ම රෝග විශේෂඥයෙකු විසින් දිනපතා පාවිච්චි කිරීම සඳහා යම් බෙහෙතක් නිර්දේශ කරන ලදි. නිමාලී රෝහලේ ඖෂධ වෙළඳ සැලකින් එම බෙහෙත් මිල දී ගත්තාය. ඖෂධ වෙළඳ සැල පවත්වාගෙන යනු ලැබුවේ 'සීමාසහිත බෙහෙත් කඩේ' සමාගම මගිනි. 'සීමාසහිත බෙහෙත් කඩේ' සමාගම සහ නවයුගය

He wrote that the months following the tsunami had been extremely beneficial to those who claimed to help the victims, stating "an organization working in the Eastern Province claims to have rebuilt many houses for the victims, but it is interesting to see the improvements done to the "habitat" of the Chairperson in the last few months. Was he too affected by the tsunami?"

Niranjan wishes to bring an action against Sanath for defamation. Discuss whether the elements for a defamatory action are present and whether Sanath has any defences.

7. 'The law of private nuisance will intervene only in the case of actions which amount to a substantial and unreasonable interference with the use and enjoyment of land.'

   Giving special emphasis to the words underlined, critically discuss this statement with reference to decided cases.

8. Write a comprehensive analytical note on one of the following

   (a) The element of a "special relatonship" in the law relating to negligent mis-statements
   (b) The maxim of *res ipsa loquitur*
   (c) Defences to the rule in *Ryland* v. *Fletcher*

COPYRIGHTS RESERVED
**********************